මහනුවර මහා නගර සභාව - 2023

---------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **ව්‍යාවනය කළ මතය**

මහනුවර මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මහනුවර මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

1.2 ව්‍යාවනය **කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළ කරනු ලැබේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වාහන තක්සේරු වාර්තාව අනුව, වාහන 06 ක වටිනාකම රු.129,450,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ තක්සේරු වටිනාකම ගිණුමේ ඇතුළත් කර ඇති අතර, උපලේඛනයේ නව තක්සේරු වටිනාකම ඇතුළත් කළ බව | ගිණුම හා උපලේඛනය නිවැරදිව ඉදිරිපත් කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී, පරිත්‍යාග ලෙස ලැබී රු.8,000,000 කට තක්සේරු කර තිබුණු ගිනි රථය ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර නොතිබුණු බැවින්, ගිණුම්ගත නොකළ බව | මෙම ගිනි රථය 2022 ජූනි මස මහා නගර සභාව වෙත ලැබී 2023 ඔක්තෝබර් මස තක්සේරු කර තිබුණු බැවින්, ගිණුම්ගත කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දී, ගොහාගොඩ කසළ අංගනයේ කසළ වෙන් කිරීමේ යන්ත්‍රය ස්ථාපිත කිරීම හා ඊට අදාළ ඉදිකළ ගොඩනැගිල්ල සඳහා වැය කර තිබුණු රු.32,352,015 ක් සහ රු.5,800,000 ක් වැය කර මිලදී ගත් වාහනවල බර මනින යන්ත්‍රයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වැඩ සහ ගෙවීම් අවසන් කර නොතිබුණු බැවින්, ගිණුම්ගත නොකළ බව | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස අතරැදී මුදල් ද නිදහස් කර තිබුණු බැවින්, යන්ත්‍රය ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | පෙර සවි කොන්ක්‍රීට් නිෂ්පාදන ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.6,334,711 ක තොගය ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කරන බව | සභාව සතු සියලු තොග ගිණුම්ගත කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කසළ කළමනාකරණ ව්‍යාපෘතියේ පැවැති කාබනික පොහොර තොගය හා ප්ලාස්ටික් කැට තොගයේ වටිනාකම රු.1,742,538 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | තොගය නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.273,416,649 ක් වුවත්, එය රු.138,656,299 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.134,760,350 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙ සම්බන්ධයෙන් ඉදිරියේ දී සොයා බැලීමට කටයුතු කරන බව | මුද්දර ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (උ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම රු.374,293,021 ක් වුවත්, එය රු.380,360,476 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වරිපනම් බදු රු.6,067,455 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පසුව පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව | වරිපනම් බදු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු රු.27,770,853 ක වෙළඳ බලපත්‍ර ගාස්තු හා කර්මාන්ත බදු ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ මුදල අය කර ගැනීමට නඩු පවරන බව | ලැබිය යුතු බලපත්‍ර ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (එ) | ඉඩම් බදුවල ඉකුත් වර්ෂවලට අදාළ ගැලපීම් එකතුව රු.745,188 ක් සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වුවත්, වර්ෂයේ බිල් කිරීම්වලින් අඩු කර ගිණුම්ගත කර තිබුණු අතර, ඉඩම් බදු ඉදිරියට ලැබීම රු.2,891,041 ක් ඉදිරියට ලැබීම් ගිණුමට බැර කිරීමකින් තොරව ලැබිය යුතු ඉඩම් බදු ශේෂයන්ගෙන් අඩුකර දක්වා තිබුණි. | 2012 වර්ෂයේ සිට සිදු වූ වෙනසක් සංශෝධනය කිරීමේ දී, සමාලෝචිත වර්ෂයේ බිල් කිරීමට එකතු කළ බව | ඉකුත් වර්ෂවලට අදාළ ආදායම් සමුච්චිත අරමුදලට බැර කළ යුතුය |
| (ඒ) | ඉකුත් වර්ෂයේ දී, සහස් උයන පරිශ්‍රය බදු දී තිබුණු අතර, මෙම පරිශ්‍රය සඳහා ලැබී තිබුණු තක්සේරු වාර්තාව අනුව, ලැබිය යුතු බදු කුලී රු.3,448,333 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පසුව පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව | ලැබිය යුතු කුලී නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඓ) | සමාලෝචිත වර්ෂයේ සරප් අංශයේ සිදු කර තිබුණු රු.5,157,042 ක මුදල් අක්‍රමිකතාවය ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මූ.රෙ. පරීක්ෂණ අවසන් වී නොමැති බැවින්, ගිණුම්ගත නොකළ අතර, හෙළිදරව් කිරීම පමණක් සිදු කර ඇති බව | මුදල් ඌනතාවය ගිණුම්ගත කළ යුතුය |
| (ඔ) | කඩ කුලී හා ටෙන්ඩර් මුදල් අය නොකර සාවද්‍ය ලෙස ලේඛන වෙනස් කර සිදු කර තිබුණු රු.23,315,017 ක මූල්‍ය අක්‍රමිකතාවය ගිණුම්වලින් හෙළිදරව් කර නොතිබුණි. | මෙ සඳහා පොලිසියේ පැමිණිල්ලක් කර ඇති අතර, මූ.රෙ. පරීක්ෂණ අවසන් වී නොමැති බව | කඩ කුලී හා ටෙන්ඩර් මුදල් අක්‍රමිකතාවය ගිණුම්වල හෙළිදරව් කළ යුතුය |
| (ඕ) | මහා නගර සභාවේ සේවය හැර යාමේ නිවේදනය නිකුත් කළ සේවකයෙකු | මෙ සඳහා පොලිසියේ පැමිණිල්ලක් කර ඇති අතර, | අය කර ගත යුතු අලාභය ගිණුම්ගත කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් මාස 49 ක කාලයක් සඳහා රු.1,792,460 ක වැටුප් ගෙවා සිදු කළ අලාභය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | මු.රෙ. පරීක්ෂණ අවසන් වී නොමැති බව | |
| (ඓ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බෝගම්බර ඇළ සංවර්ධනය කිරීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු රු.29,237,719 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මෙම මුදල කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයට අවිච්ඡේද නොකළ බව | ලැබිය යුතු මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ක) | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ ගිවිසුම්ගත වීමකින් හා වැඩ ආරම්භ කිරීමකින් තොරව ව්‍යාපෘති 414 ක ට අදාළ රු.323,754,338 ක් දෝෂ සහගතව ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | ව්‍යාපෘති අනුමත කර තිබුණ ද, වැඩ ආරම්භ කිරීමට ප්‍රමාද වී ඇති බව | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඛ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිවිසුම්ගත වී වැඩ අවසන් කර තිබුණු එකතුව රු.108,706,817 ක ව්‍යාපෘති 02 ක් ණයහිමියන් යටතේ දක්වා නොතිබුණි. | මෙම මුදල කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයට අවිච්ඡේද නොකළ බව | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයයන් 06 ක හා වගකීම් විෂයයන් 05 ක ශේෂයන් ඊට අදාළ උපලේඛනවල සඳහන් ශේෂයන් සමඟ සැසඳීමේ දී රු.212,191,924 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් එකතුව රු.2,344,906,129 ක් වුවත්, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ හා ප්‍රාග්ධනයට පරිත්‍යාගයෙන් දායක වීමේ ගිණුමේ එකතුව රු.1,283,206,617 ක් වීම හේතුවෙන් රු.1,061,699,512 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|---|
| (අ) | **2018 අංක 19 දරන ජාතික විගණන පනත** | | | |
| | 16(2) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා කාර්යයසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ආ) | **මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය)** | | | |
| (i) | 247(අ) හා (ආ) වගන්ති | මහා නගර සභාවේ බලපත්‍ර හා ව්‍යාපාර බදු ගාස්තු අය කිරීමට පළ කර තිබුණු ගැසට් පත්‍රයේ පනතේ උපදෙස් අභිභවා වාර්ෂික වටිනාකම රු.5,000 ත් රු.75,001 ත් අතර පරාසයක සංශෝධනය කර ගැසට් නිවේදන පළ කර තිබුණි. | ව්‍යාපාර ස්ථාන සඳහා ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම, ඒ කර්මාන්තයේ ව්‍යාපාර පිරිවැටුම හා ලාභය සහ ඒ කර්මාන්තය කරගෙන යෑමේදී සපයනු ලබන බඩු හෝ සේවාවල අත්‍යාවශ්‍යතාවය ස්වභාවය සැලකිල්ලට ගනිමින් සෑම වර්ෂයකම සංශෝධන සහිතව බලපත්‍ර ගාස්තු චක්‍රය සකස් කොට රජයේ ගැසට් පත්‍රයේ පල කර වෙළඳ බලපත්‍ර ගාස්තු හා කර්මාන්ත බදු ගාස්තු ගණනය කර අය කරනු ලබන බව | පනතේ විධිවිධාන අනුව ගාස්තු අය කළ යුතුය |
| (ii) | 247(අ) හා (ආ) වගන්ති | වාර්ෂික වටිනාකම රු.1,500 ඉක්ම වූ අවස්ථා 552 කදී රු.500 සිට රු.1,900 ක් දක්වා ගාස්තු අය කර මහා නගර සභා අරමුදලට රු.774,800 ක පාඩුවක් සිදු කර තිබුණි. | | |
| (iii) | 266(අ) වගන්තිය | ඉකුත් වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේ දී රු.57,678,281 ක ආදායම් විෂයයන් 05 ක හිඟ ආදායම් කපා හැර තිබුණ ද, ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | අනුමැතිය ලබා ගැනීම සඳහා ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති අතර, මේ දක්වා අනුමැතිය ලැබී නොමැති බව | හිඟ ආදායම් කපා හැරීමට පෙර විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය |
| (ඇ) | **1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනත** | | | |
| | 15 වන වගන්තිය | 2023 වර්ෂයේ පැවැත් වූ ඇසළ මෙලා සැණකෙළි 02 තුළම අභ්‍යන්තරයේ පැවැත් වූ සංදර්ශනවල ටිකට් මුද්‍රා තබා නොතිබුණු අතර, බදු අය කිරීමකින් තොරව රු.1,604,950 ක් වටිනා ප්‍රවේශ පත්‍ර 86,000 ක් නිකුත් කර තිබුණි. | පනතේ යම් යම් අර්ථ දැක්වීම් අපහැදිලි බැවින්, මීට පෙර අනුගමනය කළ පරිදි මෙවරද විනෝද බදු අය කිරීම සිදු කරන ලද බව | පනතේ විධිවිධාන ප්‍රකාරව ගාස්තු අය කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1982 අංක 04 දරන සහ 1984 අංක 44 දරන පනත්වලින් සංශෝධනය වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 28(අ)(3) වගන්තිය | අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීම සඳහා අධිකරණයේ පවරා තිබුණු නඩු කටයුතු 10 කට අදාළව කඩා ඉවත් කිරීමේ නියෝගය ලබා දී තිබුණ ද, වසර 02 ක කාලයක් ගත වී ඇතත්, සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අධිකරණ නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | කඩා ඉවත් කර නොමැති බව පිළිගන්නා අතර, පරීක්ෂා කර බලා අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | අධිකරණ නියෝග අනුව කටයුතු කළ යුතුය |
| (ඉ) | **අංක 1249 හා 2002 අගෝස්තු 08 දිනැති ගැසට් පත්‍රයේ පළ කළ මහනුවර මහා නගර සභාවේ, සම්මත අතුරු ව්‍යවස්ථාව** | | | |
| | 01 වැනි පරිච්ඡේදයේ II වන කොටසේ 14(02) | එදිනෙදා ලැබෙන සියලු මුදල් හා චෙක්පත් පසු දින බැංකුවේ තැන්පත් කළ යුතු බව දක්වා තිබුණ ද, සරප් වෙත 2022 ජූලි 01 දින සිට 2023 සැප්තැම්බර් 26 දින දක්වා කාලය තුළ ලැබී තිබුණු රු.89,000 සිට රු.3,925,423 ක පරාසයක මුදල් දින 01 සිට දින 30 දක්වා කාල ප්‍රමාදයකින් යුතුව බැංකුගත කර තිබුණි. | ප්‍රමාද කර බැංකුගත කිරීම් සිදු වී ඇත. වර්තමානයේ එය නිවැරදි කිරීමට කටයුතු යොදා ඇති බව | සම්මත අතුරු ව්‍යවස්ථා විධිවිධාන මත ප්‍රමාදයකින් තොරව මුදල් බැංකුගත කළ යුතුය |
| (ඊ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| | මු.රෙ.396(ඇ) | නිකුත් කළත්, ගෙවීමට ඉදිරිපත් නොවූ වලංගු කාලය ඉක්ම වූ රු. 1,736,878 ක් වටිනා චෙක්පත් 67 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (උ) | **චක්‍රලේඛ** | | | |
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මහා නගර සභාව සතු වාහන 150 ක ඉන්ධන දහනය දීර්ඝ කාලයක සිට පරීක්ෂා කර නොතිබුණි. | අංශ 02 ක ඉන්ධන දහන පරීක්ෂා කිරීම් අවසන්ව ඇති බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ii) | **2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය** | | | |
| | 05 වගන්තියේ (I) ඡේදය | කඩ කාමර වර්ෂ 05 න් 05 ට තක්සේරු කළ යුතු අතර, ජෝර්ජ් ඊ. ද සිල්වා වෙළඳ සංකීර්ණයේ 2013 වර්ෂයෙන් පසු 2019 වර්ෂයේ දී කඩ කාමර තක්සේරුවක් සිදු කර තිබුණ | අනුමැතිය සඳහා ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති බැවින්, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර තක්සේරුගත බදු කුලිය අය කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| | | ද,2019 ජූනි 27 දින සිට 2023 මැයි 30 දින දක්වා කඩ කාමර 145 කින් කඩ කුලී බිල් කර තිබුණ ද, රු.43,544,737 ක එම කඩ කුලී අය නොකර 2023 පෙබරවාරි 28 දිනැති අංක 08/40 දරන සභා තීරණයෙන් එම කුලී කපා හැරීමට තීරණය කර තිබුණි. | | |
| (iii) | 10 වගන්තිය | ජෝර්ජ් ඊ. ද සිල්වා වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 21 ක බදුකරුවන් රු.21,000 - රු.55,650 ත් අතර මාසික කුලී මුදලකට කඩ කාමර 21 ක් අතුරු බදු දී තිබුණි. | අතුරු බදු ලබා දී ඇතැයි හඳුනා ගත් නීත්‍යානුකූල බදුකරුවන් සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බව ලිඛිතව දැනුවත් කර ඇති බව | අතුරු බදු ලබා දුන් කඩ කාමර සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය |

2. **මූල්‍ය සමාලෝචනය**

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.718,210,138 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.627,188,401 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ලංකා බැංකුවේ හා මහජන බැංකුවේ පවත්වා ගෙන යන ජංගම ගිණුම් 02 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව, එකතුව රු.7,987,491 ක හඳුනා නොගත් තැන්පතු, එකතුව රු.514,947 ක හඳුනා නොගත් ගෙවීම් හා තැන්පත් කළ නමුත්, දීර්ඝ කාලයක සිට උපලබ්ධි වී නොතිබුණු රු.1,466,987 ක් නිරවුල් කර නොතිබුණි. | කඩිනමින් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව | ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය |

2.3 **ආදායම් පරිපාලනය**

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස් කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස් කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් හා බදු | 1,313,439,000 | 1,229,426,926 | 1,195,785,986 | 721,296,042 | 990,201,000 | 882,283,117 | 820,914,617 | 589,194,812 |
| (ii) | කුලී | 295,938,000 | 256,913,388 | 214,419,265 | 181,080,589 | 285,829,000 | 253,894,168 | 233,732,302 | 131,724,666 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 41,001,000 | 37,926,246 | 37,926,246 | -- | 40,305,000 | 34,770,109 | 34,770,109 | -- |
| (iv) | වෙනත් ආදායම් | 850,539,000 | 830,043,693 | 840,903,061 | 304,610,238 | 908,667,000 | 746,595,031 | 592,026,297 | 280,141,845 |
| | එකතුව | 2,500,917,000 | 2,354,310,253 | 2,289,034,558 | 1,206,986,869 | 2,225,002,000 | 1,917,542,425 | 1,681,443,325 | 1,001,061,323 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | **ආදායම් රැස් කිරීම** | | |
| | සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවැති හිඟය රු.1,001,061,323 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එය රු.1,206,986,869 ක් වීම හේතුවෙන් හිඟ ආදායම්වල වර්ධනය සියයට 20 ක් විය. | හිඟ ආදායම් අය කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.205,363,030 ක් වූ අතර, ඒකකයක හිඟය රු.500,000 ක් ඉක්මවා තිබුණු වරිපනම් ඒකක 30 කින් රු.36,846,801 ක හිඟ හිටි වරිපනම් ශේෂයක් මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 256 වගන්තිය ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව | හිඟ වරිපනම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | **කුලී** | | |
| (i) | අංක 1249 හා 2002 අගෝස්තු 09 දිනැති ගැසට් නිවේදනය මගින් ප්‍රසිද්ධ කරන ලද මහා නගර සභාවේ, අතුරු ව්‍යවස්ථාවේ 13(1) ට අනුව, කටයුතු කර බදු දී තිබුණු ඉඩම් 725 කින් රු.144,543,178 ක බදු කුලී ආදායමක් අය කර නොතිබුණි. | හිග අය කර ගැනීමට කටයුතු කරන අතර, සුදුසු අවස්ථාවල දී නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව | හිඟ බදු අය කිරීමට කටයුතු කළ යුතුය |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මධ්‍යම වෙළඳ පොළ මස් කඩ කාමර 07 කින් රු.6,247,952 ක ටෙන්ඩර් මුදලක් කාලීනව අය කර නොතිබුණි. | මස් කඩ නියමිත කාලයට ටෙන්ඩර් කර ගිවිසුම්ගත වීමට කටයුතු කර ටෙන්ඩර් මුදල් කාලීනව අය කර ගැනීම ද සිදු කරන බව | හිඟ කඩ කුලී අය කර ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බෝගම්බර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 54 කින් රු.7,253,371 ක හිඟ කඩ කුලී අය කර නොතිබුණි. | මේ සම්බන්ධව පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා කළමනාකරණ කමිටුව විසින් මණ්ඩලයක් පත් කර ඇති බව | හිඟ අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය |
| (iv) | දුම්රිය පොළ පාරේ නව වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ බදුකරුවන් 263 දෙනෙකුට ඉඩකඩ බදු දීමෙන්, 2015 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.24,614,082 ක බදු කුලී අය කර නොතිබුණි. | 2022 වර්ෂයේ දී මුදල් ගෙවීමට කටයුතු කළ ඉඩකඩ හිමියන් 92 දෙනා සඳහා ඉදිරියටත් එම ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා දී ඉතිරි 171 දෙනාගේ හිඟ මුදල කපා හැරීමට සභා තීරණයක් ගෙන ඇති බව | බදු මුදල් කාලීනව අය කර ගත යුතුය |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | සියලුම වෙළඳ ආයතන 2023 මාර්තු 31 දිනට පෙර බලපත්‍ර ගාස්තු ගෙවා ව්‍යාපාර පවත්වා ගෙන යා යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දින වන විට රු.27,770,853 ක මුදලක් ගෙවා නොතිබුණ ද, මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 274 (ඇ) අනුව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන අය කිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බලපත්‍ර ගාස්තු නොගෙවූ පාර්ශව වෙත නඩු දමා ගාස්තු අය කරන බව | බලපත්‍ර ගාස්තුව නීති, රීතිවලට අනුව අය කළ යුතුය |
| (ඉ) | **වෙනත් ආදායම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.184,551,257 ක ජල ආදායම් හිඟයක් පැවැති අතර, ඉන් ඒකකයක හිඟය රු.100,000 ක් ඉක්ම වූ ජල පාරිභෝගිකයින් 179 ක ගෙන් රු.80,653,971 ක් අය කර නොතිබුණි. | හිඟ ආදායම් එකතු කිරීම සඳහා විසන්ධි ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරන බව | හිඟ ජල ගාස්තු අය කළ යුතුය |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නාගරික අපජල ව්‍යාපෘතිය යටතේ පාරිභෝගිකයින් 4206 කගෙන් වසර 03 ක කාලයකට එකතුව රු.95,525,371 ක හිඟ ගාස්තු අය කර නොතිබුණි. | ජල සම්බන්ධතා විසන්ධි කිරීමට කටයුතු කිරීම තුළින් හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට දැන්වීම් පුවරු 1,719 කට අදාළ රු.34,351,290 ක හිඟ හිටි ආදායමක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ගාස්තු අය කර ගැනීමට කටයුතු සිදුකරන බව | හිඟ ආදායම් අය කළ යුතුය |
| (iv) | වසර 02 කට වඩා වැඩි කාලයක සිට පැවත එන ආයතන 17 කින් අය විය යුතු රු.845,761 ක කසළ ගාස්තුවක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | කසළ ගාස්තු කාලීනව අය කළ යුතුය |
| (v) | පුද්ගලයින් 1,321 දෙනෙකුගෙන් වසර 03 ට වඩා වැඩි කාලයක සිට හිඟ හිටි රු.38,730,686 ක ත්‍රී රෝද බලපත්‍ර ගාස්තුවක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ත්‍රී රෝද රථ බලපත්‍ර ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව | ත්‍රී රෝද රථ ගාස්තු කාලීනව අය කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (vi) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,381,772 ක් හා මුද්දර ගාස්තු රු.138,656,299 ක් විය. | මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම**

මහා නගර සභා ආඥා පනතේ 04 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා මහනුවර මහා නගර සභාව ඒකාබද්ධව අප ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2021 නොවැම්බර් 17 දින ගිවිසුම්ගත වී තිබුණු අතර, ජයිකා ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 17 ක මුදලක් හා ශ්‍රී ලංකා රජයේ මුදල් රුපියල් මිලියන 4,060 ක් යොදා ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පැකේජ 04 කින් යුක්ත වන අතර, ඉන් පැකේජ 03 යටතේ නිවාස අපජල සම්බන්ධතා 9,205 ක් ද, ආයතනවලට අපජල සම්බන්ධතා 39 ක් ලබා දීමට සැලසුම් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට නිවාස සම්බන්ධතා 3,700 ක් පමණක් පද්ධතියට සම්බන්ධ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය මහනුවර නගර සීමාව ආශ්‍රිතව ජනතාවගේ ජීවන තත්ත්වය, සෞඛ්‍ය හා සුහසාධනය ඉහළ නැංවීම යන අරමුණ ඇතුළත්ව අරමුණු කීපයක් මුල් කර ගෙන ක්‍රියාත්මක වී ඇතත්, සැලසුම් කළ අපජල සම්බන්ධතා ලබා දී නොතිබුණි. | ජයිකා ණය ආධාර අත්හිටුවීම මත නිවාස සම්බන්ධතා ලබා දීම නතර වී ඇතත්, මහා නගර සභාවේ වියදමින් සම්බන්ධතා ලබා දීමට කටයුතු කරන බව | ව්‍යාපෘතිය කඩිනමින් නිම කර අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | ගොහාගොඩ කසල අංගනයේ ගොඩනැගිලි හා යන්ත්‍ර සූත්‍ර ස්ථාපිත කිරීමට විශාල ප්‍රාග්ධන පිරිවැයක් දරා තිබුණ ද, කාබනික පොහොර නිෂ්පාදනය අඩු කර 2023 දෙසැම්බර් 12 දින සිට 2024 මාර්තු 31 දින දක්වා කාලය තුළ රු.3,142,641 ක් වැය කර කසළ ටොන් 693.74 ක් කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට ප්‍රවාහනය කර තිබුණි. එමෙන්ම, ගොහාගොඩ කසල අංගනයේ නිෂ්පාදනය කළ රු.4,738,680 ක පොහොර කිලෝ ග්‍රෑම් 470,488 ක් හා නොදිරන කසළවලින් නිෂ්පාදනය කළ රු.2,092,282 ක ප්ලාස්ටික් කැට කිලෝ ග්‍රෑම් 14,111 ක් අලෙවි කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීමකින් තොරව කසල අංගනයේ ගොඩ ගසා තිබුණි. | දෛනිකව දිරණ කසල ටොන් 60 ක් පමණ ගොහාගොඩට බැහැරලීම සිදු වූ අතර ,එයින් වර්තමානයේ පවතින කොම්පොස්ට් අංගනය සඳහා ටොන් 25 ක් පමණ බැහැර කරනු ලැබේ .ඉතිරිවන දිරණ කසල අතරින් ටොන් 15 ක් පමණ දිගන අළුත්වත්තට මුදල් ගෙවා බැහැර කරනු ලැබේ. නිෂ්පාදනය කළ කොම්පෝස්ට් හා ප්ලාස්ටික් කැට විකුණුම් කිරීමට සැපයුම් අංශය මගින් මිලගණන් කැඳවා අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබුව ද | සභාව සතු කසල කළමනාකරණය කිරීමටත්, නිෂ්පාදන විකුණා ගැනීමටත් කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | | ලොවපුරා පැතිරුණු කොරෝනා වසංගතය හේතුවෙන් මිලදී ගැනීමට අදාළ ගැනුම් කරුවන් ඉදිරිපත් නොවීම මත මෙම තත්ත්වය ඇතිවී ඇති බව | |

3.2 **හඳුනාගත් පාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මහනුවර දළදා වීදියේ අංක 74 දරන ස්මයිල් ගොඩනැගිල්ල බාහිර පාර්ශවයකට බදු දී 2015 වර්ෂයේ සිට මේ දක්වා රුපියල් මිලියන 55 ක මුදලක් අය කර නොගැනීම සම්බන්ධයෙන් මු.රෙ.104(4) පරීක්ෂණ වාර්තාව 2023 ජුලි 12 දින නිකුත් කර තිබුණු අතර, එම වාර්තාවේ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ලෙස රුපියල් මිලියන 55 ක මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කිරීමත්, එම නිලධාරීන්ට එරෙහිව මූලික විමර්ෂණයක් සිදු කිරීමටත් නියෝග කර තිබුණ ද, එම නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අලාභය අය කර ගැනීමට කටයුතු කරන බව | පරීක්ෂණ වාර්තාවල නියෝග අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | 2007 වර්ෂයේ දී මහනුවර මහා නගර සභාව සතු පුස්තකාලය ගිනි ගැනීම සම්බන්ධයෙන් සිදු කළ මු.රෙ.104(4) පරීක්ෂණ වාර්තාව අනුව, අය කළ යුතු රු.31,250,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන තෙක්ම අය කර නොතිබුණි. | මේ සඳහා පාර්ශවකරුවන් නඩුවක් ගොනු කර ඇත. එම නඩුව අවසන් වූ පසු අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව | අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | 2017 වර්ෂයේ දී, මහනුවර සිට කටුගස්තොට දක්වා ප්‍රධාන මාර්ගයට යාබඳව ජල නළ එළීමේ ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා ටෙන්ඩර් ප්‍රදානය කර රු.86,668,189 ක පාඩුවක් හා ජලනළ උපකරණ ආනයනය කර තිබිය දී, මෙම උපකරණ පරීක්ෂා කිරීමට නිලධාරීන්ට විදේශගතවීමට දැරූ වියදම් වෙනුවෙන් රු.1,500,000 ක අක්‍රමිකතාවයක් සිදු කර ඇතත්, මේ සම්බන්ධව මු.රෙ.104(3) හා 104(4) පරීක්ෂණ සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මු.රෙ 104(4) පොදු 284 ආකෘතිය ලැබි ඇතත්, එය විනය බලධරයාගේ අත්සන රහිතව ලැබී ඇති අතර, ඒ පිළිබඳ විමසීමක් 2024.05.29 දිනැතිව යොමු කර ඇති බවත්, රු.1.500,000 මුදල කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවීමට ඇති අවසන් බිල් පතින් අඩු කර ගෙවීම පිළිබඳ ඔවුන් විසින් එකගව ඇත. මෙම ව්‍යාපෘතිය මහනුවර මහා නගර සභාවට භාර දීමත් අතර යම්කිසි ප්‍රමාදයක් සිදුව ඇති බැවින්, ඒ සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.5,052,673 ක් අවසන් බිල් පතින් කපා හැරීම සම්බන්ධයෙන් ද මාගා ආයතනය එකඟතාවය එල කර ඇති බව | අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර, වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුය |

## 3.3 දූෂ්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාව සතු කැප්පෙටිපොළ, බෝගම්බර, මැණික්කුඹුර හා මධ්‍යම පොදු වෙළඳපොළ මස්කඩ, යන වෙළඳ සංකීර්ණවල කඩ 31 කින් කඩ කුලී අයකිරීමකින් තොරව ව්‍යාජ කුවිතාන්සි පත් අංක යොදා කඩ කුලී ලැබුණු බවට කඩ කුලී ලේඛනයේ සටහන් කර 2018 සිට 2023 ජූලි 31 දක්වා කාල පරිච්ඡේදය තුල රු.8,277,600 ක අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. | මු.රෙ 104(4) පරික්ෂණ සිදු කළ යුත්තේ මධ්‍යම පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් බැවින්, ඊට අදාළ මු.රෙ 104(3) සිදු කර අදාළ වාර්තා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත 2023.10.25 දිනැතිව යොමු කර ඇති බව | අක්‍රමිකතා සිදු කිරීම අධීක්ෂණය නොකළ නිලධාරීන් හඳුනා ගෙන අහිමි වූ ආදායම අය කිරීමට හා විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | මහා නගර සභාව සතු මැණික්කුඹුර, කැප්පෙටිපොළ, බෝගම්බර හා ජෝර්ජ්. ඊ.ද සිල්වා යන වෙළඳ සංකීර්ණ 04 ක කඩ කාමර 18 ක බදු අයිතිය පැවරීමේ දී අය කළ යුතු මුදල අය කළ බවට රිසිට්පත් ව්‍යාජ ලෙස සකස් කර රිසිට්පත් නොමැතිව කඩ පැවරීම හා සෞඛ්‍ය කාරක සභාවේ හා මහා සභාවේ අනුමැතියකින් තොරව කඩ කාමර පැවරීමෙන් ලබා ගත යුතු එක්වන් මුදල් සහා ආදායමට බැර නොකර, එකතුව රු.13,593,790 ක අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. මේ සම්බන්ධව මු.රෙ.104(4) පරීක්ෂණ පවත්වා අලාභය අය කර ගැනීමට හා අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ 104(4) පරික්ෂණ සිදු කළ යුත්තේ මධ්‍යම පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් බැවින්, ඊට අදාළ මු.රෙ 104(3) සිදු කර අදාළ වාර්තා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත 2024.04.22 දිනැතිව යොමු කර ඇති බව | අක්‍රමිකතා සිදු කිරීම අධීක්ෂණය නොකළ නිලධාරීන් හඳුනා ගෙන අහිමි වූ ආදායම අය කිරීමට හා විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඇ) | මහා නගර සභාවේ මුදල් භාර නිලධාරිනිය දින 02 කදී දෛනිකව එකතු කළ රු.5,157,042 ක මුදලක් බැංකුගත නොකර අවභාවිතා කර තිබුණි. මේ සම්බන්ධව මු.රෙ.104(4) පරීක්ෂණ පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මු.රෙ 104(4) පරික්ෂණ සිදු කළ යුත්තේ මධ්‍යම පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් බැවින්, ඊට අදාළ මු.රෙ 104(3) සිදු කර අදාළ වාර්තා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත 2024.02.07 දින යොමු කර ඇති බව | මුදල් දෛනිකව බැංකුගත කිරීම පරීක්ෂා නොකළ නිලධාරීන් හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඈ) | මහනුවර මහා නගර සභාව සතු මධ්‍යම වෙළඳ පොළ ඉඩකඩ, ගුඩ්ෂෙඩ් පහල මහල, ගොහාගොඩ, කටුගස්තොට පාර, දුම්රිය පොළ පාර A හා B, දෙයියන්නේවෙල, දංගොල්ල හා අරුප්පල යන වෙළඳ සංකීර්ණවල කඩ කාමරවල කුලී ලේඛනවල කාර්තුවකින් කාර්තුවකට, වර්ෂයෙන් වර්ෂයට, කඩකුලී ලේඛන තුලනය කර, ශේෂයන් ඉදිරියට ගෙනයාමේ දී, ව්‍යාජ සටහන් තබා හා ආදායම බිල් නොකර 2016 වර්ෂයේ සිට 2023 අගෝස්තු 31 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව රු.1,443,627 ක අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. මේ සම්බන්ධ මු.රෙ.104(4) පරීක්ෂණය පවත්වා අය කිරීම හා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | 104(3) පරීක්ෂණය සම්පූර්ණ කර 2024.01.12 දිනැතිව පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත.<br>මූලික විමර්ශනයක් සිදු කරන මෙන් 2023.10.27 දිනැතිව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇත.<br>මු.රෙ.104(4) කමිටුව පත් කර පරීක්ෂණ කටයුතු මාසයක් තුළ නිම කරන බව | මහා නගර සභාවට සිදු වූ අලාභය අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමටත්, විනයානුකූල පියවර ගැනීමටත් ක්‍රියා කළ යුතුය |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (ඉ) | මහා නගර සභාවේ, ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) කම්කරුවකු 2019 අප්‍රේල් 10 දින සිට 2019 අගෝස්තු 08 දින තෙක් මාස 04 ක් සේවය කර සේවය අතහැර ගොස් තිබුණි. මෙම සේවකයාට 2019 අගෝස්තු 08 දින සිට 2023 අගෝස්තු මාසය දක්වා වසර 04 ක කාලයක් වැටුප් ගණනය කර රු.1,792,460 ක මුදලක් ගෙවීම් කර තිබුණි. පඩි ලැයිස්තුවෙහි "ස්ථාන මාරු" ලෙස සටහන් කර තිබියදීත්, වැටුප නතර කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් මහා නගර සභා අරමුදලට පාඩුවක් සිදු වී තිබුණි. | මු.රෙ 104(4) පරීක්ෂණ සිදු කළ යුත්තේ මධ්‍යම පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් බැවින්, ඊට අදාළ මු.රෙ 104(3) සිදු කර අදාළ වාර්තා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත 2023.10.27 දින යොමු කර ඇති බව | නොසැලකිල්ලෙන් කටයුතු කළ නිලධාරීන්ගෙන් මහා නගර සභාවට අහිමි වූ ආදායම අය කිරීමටත්, විනයානුකූලව පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය |

3.4 **අවිධිමත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | මහනුවර මහා නගර සභාවට අයත් නාගරික රථගාල ඉහළ කොටස (සහස් උයන) වෙළඳ කුටි 100 ක් මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වසර 15 කට බදු දීම සඳහා 2023 මැයි 12 වන දින සිදු කළ ටෙන්ඩර් කැඳවීමට අනුව, ලංසු 02 ක් ඉදිරිපත් කර තිබුණු අතර, ප්‍රතික්ෂේප කර තිබුණු ටෙන්ඩර්පත ව්‍යාජ ලෙස සකස් කර තිබුණු බවක් නිරීක්ෂණය විය. එසේම, මහා නගර සභා ආඥා පනතේ 40(1)(ඊ) වගන්තිය ප්‍රකාරව, විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව වෙළඳ කුටි 100 ක් දීර්ඝ කාලීනව බදු පදනම මත වසර 15 ක් සඳහා බදු දී තිබුණි. මෙම වෙළඳ කුටිවලින් ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව, කුලී අය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඇටලන්ටා සමාගම විසින් ඉදිරිපත් කරන ලද අත්සන් සහ අනෙකුත් කාරණා පිළිබඳව ඇගයීම් සිදු කළ ද, අවසන් ප්‍රතිඵලය වන්නේ මූලික සුදුසුකම් සපුරා නොමැතිකම නිසාම මෙම ලංසුකරුගේ ලංසු ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කර ඇති බව | ටෙන්ඩර් හා තාක්ෂණික ඇගැයීම් කමිටු වගකීමෙන් කටයුතු කර ව්‍යාජ ලේඛන හඳුනා ගෙන නීති මඟින් කටයුතු කළ යුතුය |
| (ආ) | මස් කඩ කාමර වසරකට බදු දිය යුතු වුවත්, මැණික්කුඹුර වෙළඳ සංකීර්ණයේ එළුමස් කඩ කාමරය 2018 අප්‍රේල් 01 දින සිට 2034 දෙසැම්බර් 14 දින දක්වා වසර 16 කට බදු දීමෙන් වාර්ෂිකව ලබා ගත හැකිව තිබුණු ටෙන්ඩර් ගාස්තු එකතුව රු.2,350,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | 2018.02.23 දින අංක 2418 දරණ තීරණය මගින් රු.153,000 කට වසරක කාලයක් සඳහා ලබා දී ඇත. නමුත් ගිවිසුම් ගත වීමේදී වසර 05 ක් සඳහා ගිවිසුම් අත්සන් කර, වසර 10 ක් සඳහා ටෙන්ඩර් කාලය දීර්ඝ කර ඇති බව | මස් කඩ කාමර වාර්ෂිකව බදු දීමට කටයුතු කළ යුතුය |

3.5 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම වෙළඳ පොළේ බදු කාලය අවසන් වූ මස් කඩ කාමර 10 කින් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.1,293,638 ක ටෙන්ඩර් මුදලක් හා රු.559,342 ක කඩ කුලී මුදලක් අය කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණ පිළිගන්නා අතර, මෙම හිඟ මුදල් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව | හිඟ මුදල් අය කර ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | කැප්පෙටිපොළ වෙළඳ සංකීර්ණයේ 8/34, 8/35 හා 8/36 යන කාමර 03 2018 වර්ෂයේ දී, වර්ෂයක කාලයකට ටෙන්ඩර් කැඳවා තිබුණ ද, 2018 පෙබරවාරි මස සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා ටෙන්ඩර් කැඳවීමකින් තොරව එම බදුකරුටම ලබා දී තිබුණි. එසේම, කුලී අය කිරීමකින් තොරව අංක 8/33 කඩ කාමරය ද, මෙම බදුකරුටම අනවසරයෙන් භුක්ති විඳීමට ඉඩ සළසා තිබුණු අතර, මෙම කඩ කාමර 04 එකතු කර බිත්ති කඩා ස්වරූපය වෙනස් කර ආහාර අළෙවි කර ගෙන යන ව්‍යාපාරයක් ගිවිසුම්ගත වීමකින් තොරව පවත්වා ගෙන යාමට ඉඩ සලසා තිබුණි. මෙම ව්‍යාපාරයේ ආහාර පිසීමට බෝගම්බර වෙළඳ සංකීර්ණයේ බී 09, 10, 11 කඩ කාමර 03 ද අවිධිමත්ව ලබා දී තිබුණි. මීට අමතරව මෙම බදුකරුට එහි අංක 8/28, 8/29 හා 8/30 යන කඩ කාමර 03 ද අතුරු බදු ලබා ගෙන බිත්ති කඩා ස්වරූපය වෙනස් කර, පවත්වා ගෙන ගිය ද, මේ සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නැති බව | වර්ෂයකට බදු දුන් කඩ කාමරය බදු ගිවිසුමකින් තොරව පවත්වා ගෙන යන බැවින්, හා කඩ කාමරවල ස්වරූපය වෙනස් කර ඇති බැවින්, කඩය සභාව වෙත පවරා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඇ) | මහා නගර සභාව සතු ටොරින්ටන් පටු මාවතේ වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ කඩ ඉදිකිරීමට බදුකරුවන්ට ලබා දී, ඉඩම් බදු ලෙස සලකන කාමර 24 කින් ඉඩම් බදු අය කර තිබුණු අතර, වසර 23 ක සිට තක්සේරු නොකර පැරණි බදු කුලියක් අය කරමින් පැවතුණි. එසේම, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මෙම කඩ කාමර 24 න් රු.2,044,910 ක හිඟ බදු ශේෂයක් අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව | කඩ කාමර තක්සේරු කර කාලීනව බදු අය කළ යුතුය |
| (ඈ) | මහනුවර මහා නගර සභාව හා මහනුවර හොටල් සමාගම අතර ඇති වූ අංක L 5664 දරන නඩුවේ තීන්දුව ප්‍රකාරව, රැජින හෝටලයේ ඉඩම් කොටස් 03 ක අයිතිය මහා නගර සභාවට හිමි වී තිබුණි. මෙම හෝටල් පරිශ්‍රය 2011 වර්ෂයෙන් පසු තක්සේරු කිරීමට ද කටයුතු කර නොතිබුණු අතර, 2011 වර්ෂයේ තක්සේරු වාර්තාවලට අනුව, ඊට සාපේක්ෂව වැඩිවීම සැලකිල්ලට ගත් විට 1986 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය සඳහා රු.46,395,250 ක ආදායමක් අය කර ගෙන නොතිබුණි. | රැජිණ හෝටලය විසින් මහනුවර මහා නගර සභාව වෙත ගෙවීමට ඇති හිඟ මුදල අය කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, ඉදිරියේ දී හිඟ මුදල අය කිරීමට නැවත ක්‍රියා කරන බවත්, එසේ අය කිරීමට අපොහොසත් වන්නේ නම්, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | බදු මුදල් නොගෙවන්නේ නම්, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත්, සන්තතකය පවරා ගැනීමටත් කටයුතු කළ යුතුය |
| (ඉ) | මහනුවර ශ්‍රීමත් කුඩා රත්වත්තේ මාවතේ අංක 51/2 දරන GVR ලංකා පුද්ගලික සමාගම සතු මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 93 සඳහා ඉදිකිරීම් අනුමැතිය හා එම සැලැස්ම අනුව, ඉදිකිරීම් සම්පූර්ණ වූ බවට අනුකූලතා සහතිකය නිකුත් කිරීමෙන් පසු දේපළ හිමිකරුගේ ඉල්ලීම මත සියලුම නිවාස ඒකක වෙනුවෙන් නාගරික තක්සේරු අංශයෙන් ලබා දී තිබුණු තක්සේරුවත් සමඟ නව අංක ලබා දී 2018 වර්ෂයේ සිට වරිපනම් ලේඛනයේ ලියාපදිංචි කර තක්සේරු දැන්වීම් භාර දී තිබුණ ද, වරෙන්තු ගාස්තුව සමඟ රු.16,385,668 ක හිඟ වරිපනම් ශේෂයක් අය කර නොතිබුණි. | නාගරිකයට ආදායමක් අහිමි වී නොමැති බවත් වැරදි බිල් කිරීමක් සිදු වී ඇති බවත් එම වැරදි බිල් කිරීම කපා හැරීම සඳහා 2023 අගෝස්තු 16 දිනැති අංක 407 දරන ව්‍යවස්ථා ඉඩම් හා සාමාන්‍ය කරුණු පිළිබඳ ස්ථාවර කමිටුව සහ කළමනාකරණ කමිටු නිර්දේශය අනුව ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | තක්සේරු දැන්වීම් භාර දුන් පසු අය කර පනත ප්‍රකාරව කටයුතු කර නොමැත. එබැවින්, වරිපනම් අය කළ යුතුය |
| (ඊ) | මහනුවර මහා නගර සභාවට අයත් ගිණිහිරිය ගම්මානය ආසන්නයේ දුණුමඩලාව රක්ෂිතයට අයත් බදු පදනම මත දීමට යෝජනා කළ ඉඩමක් ජාතික | ජාතික ගොඩනැගිලි පරියේෂණ ආයතනයේ වාර්තාව ලැබීමෙන් පසු එම නිර්දේශ පදනම් කර | ජාතික ගොඩනැගිලි පරියේෂණ සංවිධානයේ (NBRO) |

| | | |
|---|---|---|
| ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශය අනුව, පදිංචියට නුසුදුසු බව දන්වා තිබියදිත්, අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගනිමින් කළමනාකරණ කමිටු තීරණයක් ලබා ගැනීමට නියමිත බව | වාර්තාව අනුව, මෙම ඉඩම් 02 ක නේවාසික භාවිතයට යෝග්‍යා නොවන බව වාර්තා කර ඇති බැවින්, එම නියෝග අනුව කටයුතු කළ යුතුය |

3.6 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|---|
| (අ) | මධ්‍යම වෙළඳපොලේ ඉඩකඩ රු.1,000 ක මාසික කුලියකට වෙළෙඳුන් 113 කට බදු දී තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මෙම ඉඩකඩවලින් රු.13,613,666 ක බදු මුදලක් අය කර ගෙන නොතිබුණි. එසේ වුව ද, එම වෙළෙඳුන් එම ඉඩකඩ දිනකට රු.300 සිට රු.500 ක පරාසයක අගයකින් වෙනත් පුද්ගලයින්ට අතුරු බදු දී ආදායම් ඉපයුව ද, මහා නගර සභාවට අය විය යුතු හිඟ මුදල් අය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | අතුරු බදු දීමක් සිදු කර ඇත්නම්, ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන අතර, හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ බදු මුදල් කාලීනව අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | බෝගම්බර වෙළඳ සංකීර්ණයේ B, C, D කොටස්වල කඩකාමර කිසිදු අනුමැතියකින් තොරව 2019 සැප්තැම්බර් 30 දින සිට බිල් කිරීම නවතා දමා තිබුණ ද, පරීක්ෂාවට භාජනය වූ කඩ කාමර 18 ක් ව්‍යාපාර කර ගෙන යන බවක් නිරීක්ෂණය වූයෙන්, 2019 ඔක්තෝබර් 01 දින සිට 2023 අගෝස්තු 31 දින දක්වා කාලය තුළ කඩකාමර 20 කින් රු.1,612,500 ක ආදායමක් සභා අරමුදලට අහිමි කර තිබුණි. | බිල් කිරීම ආරම්භ කිරීම සඳහා කමිටු තීරණය අනුව කටයුතු කරන බව | කඩ කාමර අළුත්වැඩියා කර බදු මුදල් අය කළ යුතුය |
| (ඇ) | මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රසිද්ධ ව්‍යාපාර 03 ක වරිපනම් බදු අය කිරීම සම්බන්යෙන් සිදු කළ නියැදි භෞතික පරීක්ෂාවේ දී, භෞතික වෙනස්වීම් සැලකිල්ලට නොගෙන වරිපනම් බදු අය කිරීම හේතුවෙන්, 2012 වර්ෂයේ සිට 2023 දක්වා කාලය තුළ රු.3,186,036 ක වරිපනම් බදු ආදායමක් මහා නගර සභා අරමුදලට අහිමි වී තිබුණි. | මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | භෞතික වෙනස්කම් සැලකිල්ලට ගෙන වරිපනම් බදු අය කළ යුතුය |
| (ඈ) | මහා නගර සභාව සතු ඉහළ වාණිජ වටිනාකමක් සහිත ඉඩම් බදු දීම සඳහා අංක 2013/06 දරන චක්‍රලේඛයක් ද නිකුත් කර ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදයක් ද හඳුන්වා දී තිබුණ ද, මහා නගර සභාව සතු නාගරික ප්‍රදේශ 09 ක ඉඩම් කට්ටි 790 ක අනවසර පදිංචිකරුවන් ඉඩම් භුක්ති විඳිමින් පැවතුණ ද, එම ඉඩම් තක්සේරු කර බදු දීමට කටයුතු කර නොතිබීමෙන් විශාල ආදායමක් මහා නගර සභාවට අහිමි වී තිබුණි. | ඉඩම් තක්සේරු කර ගිවිසුම්ගතව බදු දීමට කටයුතු කරන බව | ඉඩම් තක්සේරු කර බදු දී ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය |
| (ඉ) | මහනුවර මහා නගර සභාව සතු අංග 05 කින් සමන්විත නාගරික රථගාලේ ඉහළ මහළ 2022 අප්‍රේල් මාසයේ වසර 15 කට මෙහෙයුම් කල් බදු ක්‍රමය මඟින් බදු දී තිබුණු අතර, 2022 අප්‍රේල් සිට | තක්සේරු වාර්තාව අනුව, හිඟ මුදල ගෙවන ලෙස බදුකරු දැනුවත් කර ඇති බව | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | 2023 ඔක්තෝබර් දක්වා කාලයට අදාළ රු.3,448,333 ක බදු කුලී සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අය කර නොතිබුණි. | | |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාසික ජල ගාස්තු ගණනය කිරීමේ දී, අක්‍රීය මනු, වසා දමා ඇති මනු, දීර්ඝ කාලයක සිට වසා දමා පදිංචියෙන් තොර පරීක්ෂා කළ නොහැකි මනු වැනි විවිධ හේතු නිසා ස්ථාවර ගාස්තු අය කරන මනු 1500 ක් පමණ ප්‍රමාණයක් නිරීක්ෂණය වන අතර, මෙ ප්‍රමාණය අඛණ්ඩව වර්ධනය වන බවත් මහා නගර සභාවට ලැබෙන ආදායම අඩුවන බවත් නිරීක්ෂණය විය. | අක්‍රීය මනු, වසා දමා ඇති මනු සඳහා ඉදිරියේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව | මහා නගර සභාවට ලැබිය යුතු ජල ආදායම් අය කර ගැනීමේ ක්‍රමවේදය විධිමත් කළ යුතුය |
| (උ) | එක් ජල පාරිභෝගිකයෙකුගේ අංක 3066 දරන ජල මනුවෙන් රු.1,784,870 ක හිඟයක් පැවැති බැවින්, ජල මනුව 2016 සැප්තැම්බර් මස විසන්ධි කර නැවත 2016 ඔක්තෝබර් 10 දින ජල සම්බන්ධතාව ලබා දී තිබුණි. එදින සිට බිල් කිරීම් කර නොතිබුණ ද, 2024 අප්‍රේල් 24 දින දක්වා ජල ලීටර් 1,624,495 ක් භාවිතා කර තිබුණි. එසේ වුව ද, හිඟය හා බිල් නොකළ වටිනාකම අය කර නොතිබුණි. එසේ තිබිය දී, එම පාරිභෝගිකයාට අංක 3065 හා අංක 13137 දරන ජල මනු 02 කින් ජල සම්බන්ධතාවය ලබා දී තිබුණු අතර, ඉන් එකතුව රු.4,642,624 ක ජල ගාස්තුවක් සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා අය කර නොතිබුණි. | ශ්‍රී දළදා මාළිගාවේ ජල සැපයුම් සඳහා අදාළ බිල්පත මධ්‍යම පළාත් සභාව මගින් අයකර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව | හිඟ ආදායම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය |

## 3.7 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | දුම්රිය පොළ පාරේ නව වෙළඳ සංකීර්ණයේ වර්ග අඩි 5582 ක පමණ ප්‍රමාණයෙන් යුත් කොටසක් අමතර පන්ති පැවැත්වීමේ ව්‍යාපාර ස්ථානයක් සඳහා වසර 05 ක කාලයක් සඳහා තාවකාලිකව බදු දීමට තීරණය කර තිබුණ ද, 2023 වර්ෂයේ දී කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකිරීම හේතුවෙන් සභාව තීරණය කළ අවම ලංසුව අනුව, මසකට රු.175,000 ක් බැගින් රු.2,100,000 ක ආදායමක් සභා අරමුදලට අහිමි වී තිබුණි. | 2023.06.28 දින අංක 195 දරණ කළමණාකරන තීරණය මගින් අවශ්‍ය පහසුකම් සකස් කර මහනුවර දුම්රියපොල පාර නව වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ අමතර පන්ති පවත්වා ගෙන යාමේ ව්‍යාපාරයක් සඳහා බදු ලබා දීමට තීරණය කළ ද, එම යෝජනාව ක්‍රියාත්මක නොවුණු බව | සභාව සතු වත්කම් උපයෝජනය කර ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය |
| (ආ) | සභාව සතුව පැවැති එකතුව රු.22,946,987 ක වාහන 09 ක් වසර 06 ක පමණ කාලයක සිට නිෂ්කාර්යයව පැවතුණ ද, අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී මේ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | වාහන ඵලදායීව උපයෝජනය කළ යුතුය |
| (ඇ) | සභාව සතු ජල බවුසරයක් රු.729,690 ක මුදලක් වැය කර අළුත්වැඩියා කර තිබුණ ද, එම බවුසරය ධාවන තත්ත්වයෙන් තොරව වසර 03 ක කාලයක් යාන්ත්‍රික වැඩ පොළෙහි ගාල් කර තිබුණි. | ඉදිරියේ දී මේ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය |

3.8 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| මධ්‍යම වෙළඳපොළ, මධ්‍යම වෙළඳපොළ එළවළු අළෙවි කරන කොටස හා ටොරිංටන් පටු මාවත වෙළඳ සංකීර්ණය සංවර්ධන කටයුතු වර්ෂ ගණනාවකින් සිදු කර නොතිබීම හේතුවෙන්, පාරිභෝගිකයින් හා වෙළෙඳුන් අපහසුතාවයට පත් වී තිබුණි. | ඉදිරියේ දි අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව | කඩිනමින් අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය |

3.9 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| 2019 සිට 2023 දක්වා කාලය තුළ ඉටු කිරීමට සැලැසුම් කළ රු.578,851,567 ක ව්‍යාපෘති 429 ක් ඉටු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | සැලැසුම් කළ කාර්යයන් ඉටු කළ යුතුය |

3.10 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2003 සැප්තැම්බර් 05 දිනැති අංක 1304/18 දරන ගැසට් පත්‍රයේ පළ කළ මහා නගර සභා අතුරු ව්‍යවස්ථාවේ III කොටස 04, 06, 07 වගන්ති ප්‍රකාරව මිල ගණන් කැඳවීමකින් තොරව හදිසි මිලදී ගැනීම් ලෙස දක්වා වාහන අමතර කොටස් අවස්ථා 35 කදී රු.3,974,845 ක් වැය කර මිලදී ගෙන තිබුණි. ඉහත මිල ගණන් කැඳ වූ අවස්ථා 35 න් අවස්ථා 28 ක මිල ගණන් මුද්‍රා තැබූ ලිපි කවරවල බහා ඉදිරිපත් කිරීමකින් තොරව අතින් ලබා ගෙන තිබුණු නිසා, එහි රහස්‍යභාවය ආරක්ෂා වී නොතිබුණු බව ලිපිගොනු පරීක්ෂාවේ දී අනාවරණය විය. | ඉදිරියේ දී පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව සිදු කළ යුතුය |
| (ආ) | 2003 සැප්තැම්බර් 05 දිනැති අංක 1304/18 ගැසට් පත්‍රයේ පළ කරන ලද මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ 4, 6, 7 වගන්ති ප්‍රකාරව මිල ගණන් කැඳවීමකින් තොරව ලංසු ආරාධනා දුරකථනයෙන් ලබා ගෙන මහා නගර සභාවේ නව ශ්‍රවණාගාරය විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් වේදිකා පසුතළ, LED තිර, වේදිකා ආලෝකකරණ සංදර්ශන හා වීඩියෝගත කිරීම සඳහා රු.1,557,200 ක වටිනාකමකට ලංසුකරුවෙකු තෝරා ගෙන රු.969,975 ක මුදලක් ගෙවීම් කර තිබුණි. | ප්‍රසම්පාදනය කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, අදාළ ආයතන වලට දුරකථනයෙන් දැනුම් දී මිල ගණන් ඉදිරිපත් කරන ලෙස දැනුවත් කළ අතර, මිල ගණන් 2023.12.08 දින පෙ.ව. 10.00 ට විවෘත කරන බව සඳහන් කර ඇතත්, මුද්‍රා තැබූ කවරවල එවිය යුතු බවට සටහන් කිරීම අතපසු වී ඇත. ඉදිරිපත් කර ඇති මිල | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව සිදු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | | වෙළඳපොල මිල ගණන් සමග සැසඳෙන අතර, මේ සම්බන්ධ අත්දැකීම් සහිත සහ මහනුවර මහා නගර සභාවට ආසන්නතම පිහිටි බැවින්, මෙම ආයතනය තෝරා ගත් බව | |
| (ඇ) | මහනුවර වැවේ බෝට්ටු සේවාව පවත්වා ගෙන යාමේ බදු අයිතිය වසර 05 කට පවරා දීම සඳහා ටෙන්ඩර් කැඳවා තෝරා ගත් ටෙන්ඩර්කරු ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර තිබීම හේතුවෙන්, ටෙන්ඩරය ප්‍රතික්ෂේප කර තිබුණ ද, අදාළ ටෙන්ඩර්කරු අසාධු ලේඛනගත කර නොතිබුණි. | එම ටෙන්ඩර් කරු අසාධු ලේඛණ ගත කරන බව | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව සිදු කළ යුතුය |

## 3.11 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට සහා අරමුදල් රු.5,443,629 ක් වැය කර ඉදිකරමින් පැවතුණ කටුකැලේ ප්‍රජාශාලාව ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ වැඩ 2020 ඔක්තෝබර් 13 වන දින ආරම්භ කර 2021 ඔක්තෝබර් 13 වන දින වන වැඩ අවසන් කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට එහි ඉදිකිරීම් අතහැර දමා තිබුණි. එකතුව වැඩ විෂයය 12 ක ඉටු කර තිබුණු වැඩ ප්‍රමාණයට වඩා වැඩි වැඩ ප්‍රමාණයක් දක්වා රු.1,478,703 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් කල ප්‍රමාණය රු.1,151,993 ක් වන අතර, එම වැඩිපුර ගෙවන ලද මුදල නැවත ලබා දෙන ලෙස කොන්ත්‍රාත්කරුට ලිඛිතව දන්වා ඇත. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් ඉටු කරන ලද දොඩම්වල බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම කර්මාන්තයේ හා මෙම කර්මාන්තයේ රැඳවුම් මුදල් වලින් එම මුදල අයකර ගන්නා ලෙස ඉල්ලීමක් කර ඇති බව | ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් හඳුනා ගෙන ඒම නිලධාරින් සම්බන්ධ ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.7,783,230 ක් වැය කර ඉදිකරමින් පැවතුණ දොඩම්වල බහු කාර්යය ගොඩනැගිල්ල බිම් මහළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුගත මිනුම් පිළියෙල කර නොතිබුණු අතර, වැඩ විෂයයන් 06 ක ඉටු කළ ප්‍රමාණයට වඩා වැඩි වැඩ ප්‍රමාණයක් දක්වා වැඩිපුර රු.939,212 ක් ගෙවා තිබුණි. එසේම, වැඩ විෂයය අංක 15 පස් කැපීම සඳහා ටෙන්ඩර්කරු ඝන මීටරයක් වෙනුවෙන් රු.2,000 ක් අයදුම් කර තිබිය දී, ව්‍යාජ ලෙස රු.20,000 ක් ලෙස දක්වා ඝන මීටර් 83.54 කට රු.18,000 ක් බැගින් රු.1,503,720 ක් ද, වැඩ විෂයය අංක 76 (R3) යටතේ ලීටර් 500 ප්ලාස්ටික් ජල ටැංකියක් සඳහා ටෙන්ඩර්කරු රු.15,000 ක් අයදුම්කර තිබිය දී, රු.150,000 ක් ගෙවීම හේතුවෙන්, රු.135,000 ක් වැඩිපුර ගෙවා අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. | අංක 2 හි 2.1 හි සඳහන් ආකාරයට දෙවන බිල්පතේ 15 අයිතමය සඳහා මිල ගණනට වැඩිපුර 0 ක් යෙදී රුපියල් 20,000 ලෙස සඳහන්වීම හා එය බිල්පත පරීක්ෂා කිරීමේදී අවධානයට යොමු නොවීම හේතුවෙන් වැඩිපුර ගෙවීමක් සිදුවී ඇත. නමුත් පසුව කොන්ත්‍රාත්කරු විසින් තෙවන බිල්පත ඉදිරිපත් කර ඇති අතර එහිදී එම මිළ ගණන නිවැරදි කර ඇති බව<br>තාක්ෂණික ඇගයීම් වාර්තා සකස් කිරීමේ දී සිටම ජල ටැංකියේ කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ රු15,000 ක මුදල රු.150,000 ලෙස මුද්‍රණය වීම හේතුවෙන් ගිවිසුමට ද එය රු150,000 ලෙස යොදා ඇත. මෙය තෙවන බිල්පතේ දී නිවැරදි කර ඇති බව | ඉටු කළ වැඩ සඳහා ගෙවීම් කළ යුතු බවත්, ව්‍යාජ මිල දක්වා වැඩිපුර ගෙවීම් කළ නිලධාරීන් හඳුනා ගෙන ක්‍රියාමාර්ග ගත යුතුය ජල ටැංකියට ගෙවීම් කර තිබුණේ අවසන් බිල්පතින් බැවින්, එය නිවැරදි කළ නොහැකි බැවින්, අදාළ නිලධාරීන් හඳුනා ගෙන ක්‍රියාමාර්ග ගත යුතුය |

## 3.12 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 70 කට අදාළව පුරප්පාඩු 491 ක් හා තනතුරු 03 කට අදාළ අතිරික්ත සේවකයින් 33 ක් පැවතුණි. | රජය විසින් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයක් අනුව සියලුම බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බව | පුරප්පාඩු පුරවා ගත යුතුය |
| (ආ) | මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව, එක් සේවා ස්ථානයක වසර 05 කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරුවලට යටත් විය යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට නිලධාරීන් 48 ක් වසර 05 ත් වසර 35 ත් අතර කාලයක් මහා නගර සභාව තුළ අඛණ්ඩව සේවයේ යොදවා ගෙන තිබුණි. | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් සඳහා පසුගිය වසර 5 කාල සීමාව තුල වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක වීනැත .ශ්‍රී ලංකා ආයුර්වේද සේවයට අයත් ප්‍රධාන ආයුර්වේද නිලධාරිනිය එම තනතුරට පත්වී කෙටි කාලයක් බැවින් හා මේ වන විටත් මහනුවර මහා නගර සභාවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරී වන හෙයින් සේවා අවශ්‍යතාවය මත තවදුරටත් රාජකාරී ඉටු කරනු ලබන බව | ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය |
| (ඇ) | 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවල XVIII වැනි පරිච්ඡේදයේ 251 ප්‍රකාරව, අනුමත ස්ථාන මාරු සිදු කළ යුතු වුවත්, සභා පත්වීම් ලැබූ සේවකයින් මහා නගර සභාව තුළ විවිධ අංශවලට මාරු නොකර වසර ගණනාවක් එක් ස්ථානයක රඳවා සේවය ලබා ගැනීම් නිරීක්ෂණය විය. | මහා නගර සභාවට අදාල ලෙස පත්වීම් ලබන කම්කරු නිලධාරීන් කොට්ඨාශ අතර අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම 2024 වර්ෂයේ දී, කිරීමට නියමිත බව | අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රමවේදයක් ඇති කළ යුතුය |
| (ඈ) | සේවය අත හැර ගිය, මිය ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 110 කුගෙන් රු.10,305,691 ක සේවක ණය වසර 02 සිට වසර 13 අතර කාලයක සිට අය කර ගෙන නොතිබුණි. | සේවය හැර ගිය / මිය ගිය / විශ්‍රාම /වැඩ තහනමට ලක්වූ සේවකයන්ගේ ණය ශේෂ අයකර ගැනිම සම්බන්ධයෙන් සභාව දැනුවත් කර ඇති අතර, සේවකයන් 06 දෙනෙකුගේ ණය ශේෂ ඇපකරුවන්ගෙන් අය කර ගන්නා බව | හිඟ අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

## 3.13 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| කාර්මික වැඩ පොළ මඟින් 2023 වර්ෂයේ වාහන 03 ක් සඳහා ග්‍රීස් නිකුත් කිරීමේ දී, එම වාහනවල ධාවනය කළ යන්ත්‍ර පැය ගණන අනුව ලබා ගත යුතු ග්‍රීස් ප්‍රමාණය කි.ග්‍රෑ.173 ක් වුවත්, ලබා ගත් ග්‍රීස් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 609 ක් හෙයින්, ග්‍රීස් කිලෝ ග්‍රෑම් 436 ක් වැඩිපුර නිකුත් කර රු.2,390,325 ක මුදලක් අවභාවිතා කර තිබුණි. | ඉදිරියේ දී මේ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | වාහන වර්ගය අනුව අවශ්‍ය ග්‍රීස් ප්‍රමාණය පමණක් නිකුත් කළ යුතුය |

4. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටලු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිදේශය** |
|---|---|---|
| මහනුවර කළල් දොර ඇළ ප්‍රදේශයට මහා නගර සභා බල ප්‍රදේශයේ පස් කැපීම්, ගොඩනැගිලි ඉවත් කිරීම් ද්‍රව්‍ය හා වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන්, මහවැලි ගඟට රොන් මඩ එකතු වීම හා කළල් දොර හා හාලි ඇළවල්වලට මළ අප ද්‍රව්‍ය මුදා හැරීම හේතුවෙන්, පරිසර හානී සිදු වී තිබුණි. | ඉදිරියේ දී ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | අදාළ රක්ෂිතවලට හානී සිදු කිරීම පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |